දිනමිණ The Dinamina e paper



# ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ තරුණ ජාලයක් එළි දැක්වීමට පියවර

**ශිලා උඩුවර**

මෙවර ජාත්‍යන්තර තරුණ දිනය සැමරීම නිමිත්තෙන් ශ්‍රී ලංකා- එක්සත් ජාතීන් මිත්‍රත්ව සංවිධානය මගින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ තරුණ ජාලයක් ගොඩනංවා එය එළි දැක්වීමට පියවර ගනී. මේ තරුණ ජාලය ස්ථාපිත කිරීම හා එළි දැක්වීම ජාත්‍යන්තර තරුණ දිනය යෙදෙන මේ මස 12 වැනිද සවස කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී තිරසර සංවර්ධන හා වනජීවි ඇමැති ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් මේ මස 12 වැනිද ජාත්‍යන්තර තරුණ දිනය වශයෙන් ප්‍රකාශයට පත්කර තිබේ.

මේ තරුණ ජාලය එළිදැක්වීමේ අවස්ථාවට ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමති නිරෝෂන් පෙරේරා තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය ඇමැති සුමේධා ජී. ජයසේන මහත්ම මහත්මීහුද, තරුණ කටයුතු පිළිබඳ පළාත් සභා අමාත්‍යවරුන්ද, එක්සත් ජාතීන්ගේ ප්‍රධානීන්ද, තානාපතිවරුන් ද, ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25ක සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින්ම තෝරාගත් තිරසර සංවර්ධන ඉලක්ක සඳහා වන ප්‍රධාන සම්බන්ධීකාරක තරුණ නායකයන් 350ක්ද සහභාගී වන අතර තවත් ජාතික මට්ටමේ තරුණ නායකයන් සහ අමුත්තන් රැසක් ද සහභාගී වීමට නියමිතය.

තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ ජාතික තරුණ ප්‍රතිපත්තිය එළි දැක්වීමද,තිරසර සංවර්ධන ජාතික තරුණ සභාව ස්ථාපිත කිරීම හා තිරසර සංවර්ධන තරුණ මාධ්‍ය කවයක් ඇති කිරීම ද 2016 / 2017හොඳම තරුණ ව්‍යාපෘති සඳහා උපහාර දැක්වීමද මෙහිදී සිදුකෙරේ.

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම © 2012 සියළුම හිමිකම් ඇවිරිණි.